සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

දෙවන වාර පරීක්ෂණය - 2018 | 11 ශ්‍රේණිය
**இரண்டாம் தவணைப் பரீட்சை - 2018** | **தரம் 11**
**Second Term Test - 2018** | **Grade 11**

බුද්ධ ධර්මය - II
**பௌத்த சமயம் - II**
**Buddhism - II**

කාලය පැය දෙක යි
**இரண்டு மணித்தியாலம்**
**Time : Two hours**

- **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් ද හිමි වේ. මෙම ප්‍රශ්න පත්‍රයට සම්පූර්ණ ලකුණු 60 කි.

---

- කෙටි පිළිතුරු සපයන්න.

1. i. **බුදුරජාණන් වහන්සේ අසරණ වූ පුද්ගලයෙකු හෝ පිරිසක් සොයාගෙන වැඩම කොට අවශ්‍ය අනුග්‍රහය ලබාදුන් සේක.** මෙම බුදුගුණය හඳුන්වන්නේ කවර නාමයකින් ද ?
   ii. අග්‍රශ්‍රාවක දෙනම ගිහිකල හැඳින් වූ නම් මොනවාද?
   iii. සසරින් එතෙර වීමට කැමති තැනැත්තෙකු විසින් සම්පූර්ණ කළ යුතු ගුණධර්ම සමූහය හඳුන්වන නම් දෙකක් ලියන්න.
   iv. භාවනා යනු කුමක්දැයි හඳුන්වන පාලි පාඨය ලියා දක්වන්න.
   v. අනගාරික ධර්මපාලතුමාට දෙමාපියන් විසින් තබන ලද නාමය කුමක් ද ?
   vi. දස අකුසල් අතුරින් සිතින් සිදුකරන අකුසල් **දෙකක්** නම් කරන්න.
   vii. එක්තරා දේවතාවෙකු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ දිවා රෑ පින් වැඩෙන පින්කම් අතරින් **දෙකක්** ලියන්න.
   viii. **'වෙජ්ජුපපටො ජිනවරෝ'** යන්නෙහි අදහස කුමක් ද?
   ix. ධර්මය **'සංදිට්ඨික'** බව දේශනා කොට ඇත්තේ ඇයි?
   x. **'මුනිගුණාලංකාරය'** කෘතිය රචනාකළ කතුවරයා කවුරුන් ද? (ලකුණු 02x10 =20 යි )

2. i. චතුරාර්ය සත්‍යය යන්නෙහි වචනාර්ථය කෙබඳු ද ? (ලකුණු 02)
   ii. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රි ශික්ෂාවට අනුව වෙන්කර බෙදා දක්වන්න. (ලකුණු 03)
   iii. සාමාන්‍ය ජීවන ගැටළු විසඳා ගැනීමට චතුරාර්ය සත්‍ය දහම උපයෝගී කරගත හැකි ආකාරය නිදසුනක් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 05)

3. i. සුකරානි අසාධූනි..... ගාථාවේ ඉතිරි පාද සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

ii. සුකරානි අසාධූනි..... ගාථාවේ අර්ථය දක්වන්න. (ලකුණු 03)

iii. සමාජයට හිතකර වූත් යහපත් වූත් ශිෂ්‍ය චරිතයක් ගොඩනා ගැනීමෙන් ලැබිය හැකි ප්‍රතිඵල හතරක් ලියා එයින් එකක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

4. i. බුදු සමයට අනුව පරිසරය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

ii. බුද්ධ චරිතය හා සම්බන්ධ පහත සඳහන් සිදුවීම් සිදු වූ ස්ථාන නම් කරන්න. (ලකුණු 03)

(අ) පළමු දම් දෙසුම

(ආ) කිඹුල්වත්පුර ගමනේ දී ශාක්‍ය කුමාරවරුන්ගේ පැවිද්ද

(ඇ) භද්දවග්ගිය කුමාරවරු මුණගැසීම

iii. පාරිසරික සුරක්ෂිතතාව සඳහා බොදු දරුවෙකු විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හතරක් දක්වා එයින් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

5. i. සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු සුභද්‍ර භික්ෂුව විසින් කළ ලාමක ප්‍රකාශය ලියා දක්වන්න. (ලකුණු 02)

ii. පළමු, දෙවන, තෙවන ධර්ම සංගායනා සඳහා අනුග්‍රහය දුන් රජවරුන් පිළිවෙළින් නම්කරන්න. (ලකුණු 03)

iii. ශාසන චිරස්ථිතිය සඳහා අලුවිහාර සංගායනාවෙන් ලද පිටුබලය කෙබඳු දැ යි පැහැදිළි කරන්න. (ලකුණු 05)

6. i. මහින්දාගමනය සිදු වන විට සම්බුද්ධ පරිනිර්වාණය සිදු වී කොපමණ වර්ෂ ප්‍රමාණයක් ඉක්ම වී තිබුණේ ද? (ලකුණු 02)

ii. ත්‍රිපිටකයට සිංහලෙන් විවරණ සපයා තිබූ බව සැලකෙන හෙළ අටුවා ග්‍රන්ථ තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. මහින්දාගමනය නිසා මෙරට සිදු වූ සංස්කෘතික විපර්යාසය කවරාකාර ද යි දක්වන්න. (ලකුණු 05)

7. පහත සඳහන් මාතෘකා අතරින් **<u>දෙකකට</u>** කෙටි සටහන් ලියන්න.

i. සහජීවනය

ii. ආරක්ඛ සම්පදා

iii. රේරුකානේ චන්දවිමල නා හිමි

iv. සමාධි භාවනාව